# ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

## VII සභා වාරය පනස් තුන්වන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.
දිනය : 2022.07.12.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
21.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:

01.ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.

නිලධාරි සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් තුන්වන සභාව සඳහා පැමිණි ගරු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්ම මහත්මීනුත් සහ මාධ්‍යවේදී මහත්ම මහත්මීන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව, ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.06.16. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් 2022.06.16. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

08 වන පිටුවේ වෙනත් කරුණු හි "ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වගා නොකරන ලද ඉඩම් කොටස්වල ආර්ථික අපහසුතා උග්‍රවීම හේතුවෙන් ගම්වාසීන් වගා කටයුතුවල නිරත වෙමින් සිටිනවා."
යන සඳහන වෙනුවට
" ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වගා නොකරන ලද ඉඩම් කොටස්වල ආර්ථික අපහසුතා උග්‍රවීම හේතුවෙන් ගම්වාසීන් වගා කටයුතුවල නිරත වීම සඳහා ඉඩම් කොටස් ඉල්ලුම් කරනවා "
ලෙසට සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2022.06.16. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ බොල්තුඹේ කොට්ඨාසය නියෝජනය කරනු ලබන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමාගේ බිරිඳගේ ආදරණීය මෑණියන් අභාවප්‍රාප්ත වුණා. එහෙත් රටතුල පැවැති ආර්ථික කඩාවැටීමත් සමඟ ඉන්ධන නොමැතිවීම හේතුවෙන් ගාල්ල ප්‍රදේශයේ පැවැති අවමංගල්‍ය උත්සවයට සහභාගී වීමට නොහැකි වූ අතර, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මාගේත්, ගරු උප සභාපතිවරයා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේත්, ලේකම්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයේත් බලවත් ශෝකය හා කණගාටුව ප්‍රකාශ කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාල වාර්ෂික අයවැය ඇස්තමේන්තුව 2022 වර්ෂයේ දෙසැම්බර් 15 වෙනි දිනට පෙර සභා අනුමැතියට ඉදිරිපත් කල යුතු බවත්, එම ඇස්තමේන්තුව පිළියෙල කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා නියෝජනය කරනු ලබන කොට්ඨාසය තුල ක්‍රියාත්මක කිරිමට නියමිත සංවර්ධන යෝජනා තුනක් ප්‍රමුඛතා අනුපිළිවෙලට ලබා දෙන ලෙසත්, එහිදී එක් ව්‍යාපෘතියක උපරිම වටිනාකම රු. 200,000.00 ට සීමා වන පරිදි සභාව විසින් ලබා දෙනු ලබන අකෘති පත්‍රය සම්පූර්ණ කර 2022.08.29. වන දිනට පෙර සභා කාර්යාලය වෙත ලබා දීමට පියවර ගන්නා ලෙසට දන්වා සිටිනවා. පසුගිය වර්ෂයෙදිත් යෝජනා සහ අදහස් ලබාගත්තත් ප්‍රතිපාදන ලබා නොදුන් බවට ඔබතුමන්ලා තීරණය කළත්, ඔබතුමන්ලා නියෝජනය කරනු ලබන කොට්ඨාසවල සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන බැංකු ගිණුමක ස්ථාවර තැන්පතුක් ලෙස පවත්වාගෙන යන බවත්, පළාත් සභාවෙන් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු මුද්දර මුදල් ලැබීමට නියමිත බවත් එමඟින් මේ වසරේ සංවර්ධන යෝජනා සඳහා ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරනවා.

(iii). රටතුල පවතින ආර්ථක අස්ථාවර භාවයත්, ඉන්ධන හිඟවීමත් නිසා තැපැල මඟින් තොරතුරු ලබා දීමේ දී දුෂ්කරතාවයන්ට පත්වන බැවින්, එවැනි අවස්ථාවල්වලදී  මන්ත්‍රී මණ්ඩලය වෙත කඩිනමින් තොරතුරු ලබා දීම සඳහා ඔබතුමන්ලාගේත් ඔබතුමියන්ලාගේත් ක්‍රියාකරනු ලබන දූරකතන අංක, WhatsApp අංක හා Email Adderss සහා කාර්යාලයට ලබා දීමට කටයුතු කරන්න.

(03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.
කිසිවක් ඉදිරිපත් වී නැත.

(04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.
කිසිවක් ඉදිරිපත් වී නැත.

(05). යථා පරිදි කල් දී ඇති යෝජනා.
(i). රටතුල ඉන්ධන හිඟතාවය නිසා සංචාරකයින් නොපැමිණීමත්, ආර්ථික වශයෙන් ජනතාව දැඩි අර්බුධයකට පත්ව ඇති නිසාත්  ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් බෙලිහුල්ඔය දියපහස සංචාරක ගිමන්හල මඟින් 2022 වසරේ මාර්තු මාසයේ සහ ජූනි මාසයේ සභාවට ගෙවිය යුතු බදු මුදල් ගෙවීමට නොහැකි වූ බවත්, ඒ  බව සභාව දැනුවත් කිරිමට පියවර ගත් බවත් සඳහන් කරමින් එම මාස දෙක සඳහා බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් සහනයක් සලසා දෙන ලෙසට බලංගොඩ, ඕලුගංතොට, ගහ අද්දර පාර පදිංචි ඒ.එම්. ඉන්දික මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. අනතුරුව, සභාවට අයවිය යුතු බදු මුදලින් 50 % ක කොටසක් අය කරගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරමින්  එම අයකිරීම පිළිබඳව සභා ගර්භයේ රැඳී සිටි මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අදහස් විමසන ලදි.

සභාවට ගෙවිය යුතු බදු මුදලින් 50 % ක් අය කිරීම සුදුසු බවට වූ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ. නයනප්‍රිය චමින්ද කුමාර  මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව බෙලිහුල්ඔය දියපහස සංචාරක ගිමන්හල සඳහා මාර්තු සහ ජූනි මාස සඳහා සභාවට අයවිය බදු මුදලින් 50 % ක ගාස්තු අය කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, පුවක්ගහවෙල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කඳුරුගොල්ල සුසාන භූමිය මැන එම ඉඩමේ මායිම් නිරවුල් කර දෙන ලෙස මුත්තෙට්ටුවේගම එක්සත් අවමංගායාධාර සමිතිය විසින් ප්‍රාදේශීය ලේකම්තුමිය වෙතින් ඉල්ලීමක් කර ඇති බවත්, ඒ අනුව ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම මැන මායිම නිරවුල් කර ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට කටයුතු කරමින් පවතින බවත්, ඉඩම මැන රේඛා චිත්‍ර ලබා දෙන ලෙස 2022.03.08. වන දින රත්නපුර ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත ලිපියක් යොමු කර ඇති බවත්, එම ලිපියට පිළිතුරු වශයෙන් රත්නපුර ජොෂ්ඨ මිනින්දෝරු විසින් මැනුම් ගාස්තු වශයෙන් රු. 12613.24 ක මුදලක් ගෙවන ලෙස ලිපියක් යොමු කරමින් දන්වා එවා ඇති බවත්, ඒ අනුව එම මුදල චෙක් පතක් මඟින් හෝ මුදලින් ඉඹුල්පේ, ප්‍රාදේශීය ලේකම් නමට ඉදිරිපත් කරන ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
අනතුරුව, නැවතත් ගරු සභාපතිතුමා අදහස් දක්මින්,
මරණාධාර සමිතිය සතු ආදායම් තත්ත්වය අනුව මැනුම් ගාස්තු ගෙවීමට හැකි ද යන්න විමසා බලා සමිතිය මඟින් එම මැනුම් ගාස්තු ගෙවන ලෙස දැනුම් දීමටත්, සමිතියට මැනුම් ගාස්තු ගෙවීමට හැකියාවක් නොමැතිනම් සභාඅරමුදලින් මැනුම් ගාස්තු ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන  මැතිතුමා විසින්  එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව පුවක්ගහවෙල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කඳුරුගොල්ල සුසාන භූමිය මැන එම ඉඩමේ මායිම් නිරවුල් කරගැනීම සඳහා මුත්තෙට්ටුවේගම එක්සත් අවමංගලායාධාර සමිතිය මඟින් රු. 12613.24 ක් වූ මැනුම් ගාස්තු ගෙවීමට හැකි ද යන්න විමසා බලා එම මැනුම් ගාස්තුව ගෙවන ලෙස දැනුම් දීමටත්, සමිතියට එම

ගාස්තුව ගෙවීමට හැකියාවක් නොමැතිනම් සභාඅරමුදලින් එම මුදල ගෙවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

### (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද ජූනි මස 01 වන දින සිට ජූනි මස 30 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 69 සහ වවුචර් අංක 471 සිට 552 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන 2022.07.04. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවේ අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

### (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2022.07.04. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,
01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුන් සඳහා මුද්‍රිත ලිපි ශීර්ෂ පොත් මිළදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
02. ප්‍රාදේශීය සභාවේ හියුම් පයිප්ප නිෂ්පාදනය සඳහා නිෂ්පාදිත ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
03. ප්‍රාදේශීය සභාවේ Power mate WX 7000 petrol විදුලි ජනක යන්ත්‍රය අළුත් වැඩියා කිරීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සහ අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2022 ජූනි මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

(08). වෙනත් කරුණු.

(i). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
රටතුල උද්ගත වී ආර්ථික අර්බුධය යථා තත්ත්වයට පත්කිරීම සඳහා රජය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා අඩු ආදායම්ලාබීන්ට සහනාධාර මල්ලක් බෙදාහැර තිබුණත්, ගල්ලෙනකන්ද වසමේ අඩු ආදායම්ලාබීන් පිරිසකට එම සහනාධාර මල්ල නොලැබුණු බව දුරකතනය මගින් මා වෙත දැනුම් දුන්නා. එමෙන්ම අවුරුදු පහට අඩු දරුවන් සඳහා කිරි පැකැට්ටුවක් බෙදා දී තිබුණත්, ගල්ලෙනකන්ද ප්‍රදේශයේ දරුවන්ට කිරි පැකැට් නොලැබුණු බව දැනුම් දුන්නා. මේ පිළිබඳව සොයා බලා අඩු ආදායම්ලාබීන්ට සහනාධාර මල්ලත්, එම දරුවන්ටත් කිරි පැකට් සහනාධාර ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

මෙරට සිටින ගැබිණී මව්වරුන්ගෙන් 40 % ක් මන්දපෝෂණ තත්ත්වයෙන් පෙළෙන බවත්, මේ නිසා නූපන් දරුවන් ද මන්දපෝෂණ තත්ත්වයෙන් පෙළිය හැකි බවත්, පාසල් යන දරුවන් මන්දපෝෂණ තත්ත්වයෙන් පෙළෙන බැවින් එම දරුවන් ක්ලාන්ත වී වැටෙන බවත් වාර්තා වී තිබුණා. ජනතාව රවටා ලාංකේය ජනගහනයෙන් හැටනම ලක්ෂයක මනාප ලබාගෙන ආණ්ඩු පාලනය ගෙන ගිය මෙම ආණ්ඩුව මේ තත්ත්වයට වගකිව යුතුයි. මේ තත්ත්වයට මේ රට ඇද දමන්න කියලා ජනතාව ඡන්දය දුන්නේ නැහැ. දඩබ්බර සහ ජනමතයට හිස නොනමන, වැලගෙඩියක වහල්ලේ කොඳුරුවෝ එල්ලී සිටිනවා මෙන් රැඳී සිටි දේශපාලන නායකයන්ට, රාජ්‍ය සේවකයන්ට, ජූලි 09 වෙනිදා පැවැති අරගලය විසින් මේ රටට හොඳ පාඩමක් කියා දුන්නා. විරුද්ධත්වය ප්‍රකාශ කිරීම, අලුත් විදිහට වැඩ කරන්න, හිතන්න, රට ගොඩ නගන්න අලුත් පරම්පරාවක් අද බිහි වෙලා. එම පිබිදීම මේ රටට වාසනාවක් නිසා මෙරට අලුතින් නිර්මාණය කල යුතුයි. එම නිර්මාණයේ දී පක්ෂ පාට ජාතිභේද අපට වැදගත් වන්නේ නැහැ. කැප කිරීම, අවංකකම හා අධිෂ්ඨානය යන ගුණාංග වලින් මේ රට හොඳ තැනකට ගේන්න පුළුවන්. අරගල කරුවන්ගේ ක්‍රියා කලාපය රටට බලපා ඇති අතර ඉදිරියේ දී මෙරට ජනතාව විසින් ප්‍රාදේශීය සභාවන්ට, රාජ්‍ය සේවයට නිවැරදි තීන්දු තීරණ ගන්නා ආකාරයට පෙළඹවීම් කර තිබෙනවා. එම නිසා රට හරි තැනකට ගන්න හැකි වෙයි. මේ තත්ත්වය තව දුරටත් පවත්වාගෙන යාමට අරගලකරුවන්ට සුභ පතමින් අනාගතයේ බිහිවන කුමන ආණ්ඩුවක් වුවත් නිවැරදි තැනක පිහිටේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
අඩු ආදායම්ලාබීන්ට ප්‍රාදේශීය කාර්යාලයෙන් සහනාධාර මල්ලක් ලබා දුන්නත් එය ලබාගැනීමට තෝරවෙල කන්ද සිට අලුත්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගමන් කිරීමට සිදුවීමෙන් සහනාධාර මල්ලේ වටිනාකමට වඩා වැඩියෙන් ගමන් වියදම වැඩි වීම හේතුවෙන් ඔවුන් දැඩි අපහසුතාවයට පත් වෙලා. එම නිසා ඉදිරියේ දී මෙවැනි සහනාධාර ලබා දෙන අවස්ථාවල්වලදී ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් සහනාධාර බෙදා හැරීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම වතුකම්කරු ජනතාව අඩුආදායම්ලාබීන් වුවත් ඔවුන්ට එම සහනාධාර හිමි වී නැහැ. ඔවුන්ටත් එම සහනාධාර මල්ල ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.
එමෙන්ම අඩු ආදායම්ලාබීන් සඳහා රු. 5000.00 දීමනාව බෙදා හැරීමේ දී සුදුසුකම්ලත් අයට නොලැබී ඇති බැවින් එම දීමනාව සියලු දෙනාට ලබා දීමට සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකසන ලෙස ඉල්ලා සිටිනවා.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
වසර කිහිපයකට පෙර සකස්කරන ලද පොරොත්තු ලේඛන අනුව සහනාධාර බෙදා හැරීම නිසා ආර්ථික අර්බුධයත් සමඟ රැකියා අහිමි වූවන් දැඩි අපහසුතාවයට පත් ව සිටියත්, ඔවුන්ට සහනාධාර ලැබී නැහැ. එබැවින් ඔවුන්ට සහනාධාර ලබා දිමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

මොරහැල කොට්ඨාශයේ සංවර්ධනය කරන ලද පොල්වතු මාර්ගය ඇතුළු මාර්ග 05 ක පරීක්ෂණ අසමත් වීම නිසා මුදල් නොගෙවූ බැවින් ඒ පිළිබඳව සබරගමුව පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම මාර්ග ප්‍රාදේශීය සභාව සතු මාර්ග වන බැවින් සභාවෙන් තීන්දු තීරණ ගත යුතු බවට විධායක ඉංජිනේරු වෙත දන්වා යවා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරින් විසින් ලබාදෙනු ලැබූ ලිපිය මගින් අදාල ආයතන විසින් තීන්දු තීරණ ගත්තත්, සභාවෙන් ගනු ලබන තීන්දු තීරණ ඔස්සේ ඉදිරි කටයුතු මෙහෙයවීමට ඉඩ

තිබුණා. මුදල් නොගෙවීමට හේතුව සමිතිවලට දන්වා එවා තිබුණේ නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපත් කරන ලද කරුණු පමණක් සලකා බලා මුදල් අමාත්‍යාංශය විසින් මුදල් ගෙවීම නවතා දමා තිබෙනවා. මාර්ග සංවර්ධනය කිරීමට අදාල මුදල් ලබා ගැනීමට සමිති මඟින් නඩු කටයුතු ක්‍රියාත්මක කිරීමට සිදු වන්නේනම් ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ සහයෝගය ලබා දෙන්න.

2/3 බලයක් ලබාගෙන, 69 ලක්ෂයක ජනතා ප්‍රසාදයත්, ජනවරමත් ලබාගෙන වසර දෙකහමාරකින් පසුව රට මේ තත්ත්වයට වැටුණේ නායකයින් තුල පැවැති අදූරදර්ශී තීරණවලට එළඹීමත් යම් යම් අඩුපාඩුකම් පැවැතුණු නිසාත්ය. කොරෝනා වසංගත තත්ත්වය නිසා යම් ආර්ථික පසුබෑමකට ලක් වූ නිසා ජූලි 09 වෙනිදා ජනතාව අරගලයට යොමු වුණා. ලංකාව වැනි රටක නොවිය යුතු සිද්ධියක් සිදුවීම පිළිබඳව කණගාටුයි. දිගින් දිගටම සිදු වූ ආර්ථික පසුබෑම හමුවේ අදූරදර්ශී නායකයන් පලවා හැරීමට ජනතාව කටයුතු කළා. ජීවිතහානි වලින් තොර, භේදවින්න වීමකින් තොරව අරගලය නිමා වීම ගැන සතුටට පත්වුවත් ප්‍රතිපාදන නොමැතිව ඉදිරියට යා නොහැකි බැවින්, ප්‍රාදේශීය සභා ඔස්සේ ප්‍රදේශයට සේවය කිරීම සඳහා රජය විසින් ප්‍රතිපාදන සලසා දිය යුතුයි. ඉදිරියේ දී ප්‍රාදේශීය දේශපාලන නායකයන් වන අපටද ගැටලු වලට මුහුණ පාන්න සිදු වියහැකියි. සභාව නියෝජනය කළත් මාස කිහිපයක සිට සැබෑ ජනතා සේවයක් කරන්න බැරි තත්ත්වයට පත් වෙලා. කොට්ඨාසය තුල යම් සේවයක් කිරීම සඳහා දුරකතන හා ඉන්ධන දීමනා ලබාදීම ප්‍රමාණවත් බැවින් මා හට හිමි දීමනාව ජනතාවගේ සංවර්ධනය සඳහා යෙදවීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත නැවත හරවා යවන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා අදහස් දක්වමින්,
ඔබතුමාගේ යෝජනාව ඉතාමත් වටිනවා. එහෙත් ඔබතුමාට හිමි දීමනාව ආපසු හරවා යවනවාට වඩා ඔබතුමාගේ අතට ලබා ගෙන ඔබතුමා නියෝජනය කරනු ලබන කොට්ඨාසයේ දුගී දුප්පත් ජනතාවට බෙදා හැරීමට වැඩ පිළිවෙලක් සකස් කරන්න. එම දීමනාවෙන් වටිනා සේවයක් කරන්න.

එම ප්‍රකාශයෙන් අනතුරුව, නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
මොරහැල කණිෂ්ඨ විදුහලේ සහ රයි දමිළ විදුහලේ සිසු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කිරීම සඳහා මාහට හිමි වන මන්ත්‍රී දීමනාව ලේකම්තුමියගේ මූලිකත්වයෙන් බෙදා හැරීමට මා සූදානමින් සිටින බව සතුටින් යුතුව දන්වා සිටිනවා.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
ආර්ථික උද්ගමනය මහජනතාවට උසුලාගත නොහැකි ආකාරයට වර්ධනය වීමත් සමඟ 2022 ජූලි මස 09 වෙනිදා සිදු වූ අරගලය දිනයේ දී වත්මන් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවස කඩාකප්පල්කාරී ක්‍රියා සිදු කරන්නන් විසින් ගිනි තබා විනාශ කර තිබෙනවා. එම ක්‍රියාව හෙළා දකින අතර දැඩි කණගාටුව ප්‍රකාශ කරනවා.
කෘෂිකාර්මික කටයුතු සඳහා ගොවිජනතාවට රසායනික පොහොර ලබා දීමට නියමිත බව රජය විසින් ප්‍රකාශ කළත්, කෘෂිකර්මාන්ත අමාත්‍යතුමා ධූරයෙන් ඉල්ලා අස්වීම නිසා එම පොහොර ගොවිජන සේවා දෙපාර්තමේන්තු වෙතින් ගොවිජනතාවට බෙදා හැරීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතිනවා. කොට්ඨාසය තුල සිටින ගොවීන් නිරන්තරයෙන් අපෙන් ඒ පිළිබඳව විමසනවා. එම නිසා ගොවි ජනතාවට පොහොර බෙදා හැරීමේ සැලසුම පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

කිණගහඇල්ල අමුපිටිය හෙලවත්ත මාර්ගය අබලන් වීම හේතුවෙන් එම මාර්ගයේ ධාවනය වූ ශ්‍රී ලංකා ගමනා මණ්ඩලය බලංගොඩ ඩිපෝවට අයත් බස් රථයේ ධාවන කටයුතු තාවකාලිකව නවතා දැමුවත් වර්තමානය වන විට මාර්ග සංවර්ධන කටයුතු අවසන් වී ඇති බැවින් බස් රථය ධාවනය නොවීම හේතුවෙන් පාසල් දරුවන්ට පාසලට ගමන් කිරීම, උපකාර පංතිවලට ගමන් කිරීම, අසනීප වූ ගම්වාසීන්ට රෝහලට ගමන් කිරීමට නොහැකි වීම නිසා දැඩි අපහසුතාවයට පත් වෙලා. ඉන්ධන හිඟවීම හේතුවෙන් පෞද්ගලික වාහන වල ගමන් කිරීමට ද නොහැකි වීම නිසා නැවත බස් රථය දිනකට දෙවතාවක් ධාවනයේ යෙදවීමට කටයුතු සලසා දෙන ලෙසට බලංගොඩ ඩිපෝ අධිකාරි වෙතින් ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා අදහස් දක්වමින්,
රට ආර්ථික වශයෙන් අර්බුධකාරී තත්ත්වයකට පත් වීමත් සමඟ විශාල ජන අරගලයක් ඇතිවෙලා. ප්‍රදේශයේ මළ ගෙදරකට මන්ත්‍රීවරුන් ලෙස සහභාගී වන අවස්ථාවල්වලදී පළාත් පාලන ආයතන වලින් සිදු වන සේවය පිළිබඳව ප්‍රදේශවාසීන් විමසනවා. පළාත් පාලන ආයතන නමින් පෙනී සිටීම, ඒ සඳහා අනවශ්‍ය ලෙස මුදල් වියදම් වීම ඇරෙන්න කිසිදු වැඩ පිළිවෙක් පේන්න නැහැ. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවෙන් සිදු වන්නේ කසල රැස් කිරීමත් ඒ සඳහා කසල ගාස්තු අය කිරීම, පඹහින්න, ගලගම, පින්නවල ජලය බෙදා හැරීම හා ජල ගාස්තු අය කිරීම පමණයි. වීථි පහන් නඩත්තුව හෝ වෙනත් කිසිඳු සේවාවක් සිදු වන්නේ නැහැ.
අමාත්‍යවරු දවස ගානේ ඉල්ලා අස්වෙනවා. අමාත්‍යාංශ තියෙනවාද දන්නේ නැහැ. රජයක් නෑ. අමාත්‍යාංශ ලේකම්වරු ප්‍රශ්න වලට උත්තර දෙන්නේ නැහැ. ජනාධිපති වෙනුවට කතානායක පෙනී සිටිනවා. රට තුල මෙවැනි තත්ත්වයක් පවතිනවා. පළාත් පාලන ආයතන වල ධුර කාලය වසර හතරක් වුවත් මේ වන විට එම ධුර කාලය වසර 05 ක් දක්වා දීර්ඝ කර තිබීම නිසා විසුරුවා හැරීමට ඉඩ සලසා දෙමින් ගම්මට්ටමේ සිටින ප්‍රාදේශීය නායකයන් ලෙස සභාව වෙනුවෙන් යම් සේවයක් කළ යුතුයි. එහි ප්‍රතිලාභ දුගී දුප්පත් ජනතාව වෙත බෙදා දිය යුතුයි. එවැනි තත්ත්වයක් තිබෙන රටක ලබා දෙන මන්ත්‍රී දීමනාව රැගෙන යන්න අපට අයිතියක් තිබෙවාද? සිරස ආයතනය, එල්.ඕ.එල්.සී. ආයතන විසින් ආධාර ලබා දෙනවා. පළාත් පාලන ආයතන විසුරුවා හැර දැනට පවතින තත්ත්වයෙන් රට මුදවා ගැනීම සඳහා රටේ අනවශ්‍ය වියදම් කපා හැර එම මුදල් රටේ සංවර්ධනයට යොදවන ලෙස පළාත් පාලන අමාත්‍යාංශයේ වගකිව නිලධාරීන්ට මේ බව දන්වා යවන්න. ඉදිරි වසර දෙක තුල රට යථා තත්ත්වයට පත් කිරීමට හැකි බවත්, රට යාවත්කාලීනව පවත්වාගෙන යාමට තව වසරක් පමණ ගතවන බව වැඩ බලන ජනාධිපතිවරයා ප්‍රකාශ කළා. එසේ පවතින හෙයින් එම මුදල් දුගී දුප්පත් ජනතාවගේ අසරණකම වෙනුවෙන් දවසක්, වේලක් ආහාර පිරිමසා ගැනීම සඳහා ලබා දෙන ලෙසත් දන්වා යවන්න. මේ ප්‍රදේශයේ ජනතාවගේ බදු මුදලින් දීමනාවක් ගැනීමට ප්‍රාදේශීය දේශපාලනයේ නිරත වන්නන් ලෙස අපට අයිතියක් තියෙනවාද? මේ සඳහා රජය යම් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයි. කෘෂිකර්ම අමාත්‍යතුමා ඉවත් වීම සිදු වුවත්, එම අමාත්‍යාංශ ලේකම් පොහොර ගෙන්වීම පිළිබඳව දන්නේ නැහැ. මෙවැනි තත්ත්වයක් රට තුල තිබිය දී ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරු නඩත්තු කිරීම හොඳ දෙයක් නොවෙයි. ජූලි 09 වෙනිදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කොළඹ නගරය තුල නොගැවසෙන ලෙසට උපදෙස් ලබා දී තිබුණා. මෙහි දි ජනාධිපතිවරයා ඉවත් කිරීමට අරගල කරනවා. එතුමා ඉවත් නොවුනොත් 13 වන දිනෙන් පසුව මුළු රටම හර්තාල් කිරීමට සූදානමින් සිටිනවා. එවැනි අවස්ථාවන් වලදී ප්‍රාදේශීය දේශපාලනඥයන් ලෙස මේ තත්ත්වයට අපටත් මුහුණ දීමටත් මාර්ගයේ ගමන් කිරීමට හැකියාවක් නොළැබෙන්නත් පුළුවන්. ජනතාවට ආර්ථික වශයෙන් ජීවත් වීමට නොහැකි මෙවැනි අවස්ථාවක දී ප්‍රාදේශීය දේශපාලනඥයන් ලෙස යමක් කල යුතුයි. එම නිසා මා විසින් ඉදිරිපත් කල යෝජනාව සාධාරණ යැයි හැඟෙන්නේනම් කුමන හෝ මන්ත්‍රීවරයෙක් විසින් එම යෝජනාව ස්ථිර කරන්න. අනාගත පරපුර වෙනුවෙන් පළාත් පාලන ආයතන වල ධුර කාලය වසර 04 ක් දක්වා පවත්වාගෙන යමින් සේවය සැළසිය යුතු අතර සේවා සපයන්න බැරිනම් පළාත් පාලන ආයතන විසුරුවා හැරිය යුතුයි.
1948 න් පසුව ඉතිහාසයේ සිට මේ දක්වා බෝතලේ වලව්ව පරපුරේ ඩී.එස්. සේනානායක සහ ඩඩ්ලි සේනායක මැතිතුමන්ලා, හොරගොල්ල වලව්ව පරපුරේ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණිය, ඉන් පසුව මැදමුලන වලව්ව පරපුරේ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දක්වා නිදහසින් පසු වසර 74 ක කාලය තුල වසර 65 ක කාලයක් තුල මේ පවුල් තුන රට පාලනය කළා. මෙම පවුල් තුන නිසා අරගලකරුන් ලෙස ජනතාව පාරට බැහැලා ඉන්නා අතර, මේ අවස්ථාවේ දී ඔවුන් ඊට වගකියන්න ඕන. රටතුල මේ අරගල හැදුවේ බෝතලේ වලව්ව, හොරගොල්ල වලව්ව, මැදමුලන වලව්ව විසිනි. ඔවුන් විසින් යහපත් තත්ත්වයකින් රට පාලනය කළා නම් ජනතාව අරගල කරන්න පාරට බහින්නේ නැහැ. මගේ දේශපාලන අත්දැකීම් අනුව 2015 වර්ෂයේ දී ජනවාරි 15 වෙනිදා පැවැති මැතිවරණයේ දී මම මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඡන්දය ලබා දීලා පැරදුණු සභාපතිවරයෙක්. පසු දිනෙක ජෝන් සෙනෙවිරත්න මැතිතුමා සමඟ උදේ 10.00 ට කතානායක නිල නිවසේ පැමිණි සාකච්ඡාවකට කොළඹ ගියා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ රථය පාර්ලිමේන්තු සංකීර්ණ වට රවුම අසල නවතා ආරක්ෂක නිලධාරි නොමැතිව කතානායක නිල නිවසට පැමිණියා. ශ්‍රී ලං.නි.ප. පැරදුණු සියලු මන්ත්‍රීවරුන් කතානායක නිල නිවසේ පහළ මහල රැඳී සිටියා. එම අවස්ථාවේ දී මහින්ද මැතිතුමා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, චමල් රාජපක්ෂ මැතිතුමා එම නිල

නිවසේ ඉහළ මහලට ගොස් පැය 2 ½ සාකච්ඡාවකින් අනතුරුව නැවත පහළ මහලට පැමිණ පක්ෂයේ වැඩ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට මෛත්‍රීපාල සිරසේන මැතිතුමාට භාර දුන් බවත්, ඉදිරියේ දී එතුමා සමඟ දේශපාලන කටයුතු පවත්වාගෙන යන ලෙසත්, මහින්ද රාජපක්ෂ මැතිතුමා රැඳී සිටි පිරිසට දැනුම් දුන්නා. ඒ කාලවකවානුවේ දී එසේ සිදු වූ අතර වර්තමානයේ දී පවුලක් විසින් පවුලක් රැකීම සඳහා රනිල් වික්‍රමසිංහ මැතිතුමා රාජපක්ෂවරු ආරක්ෂා කිරිම සඳහා බලයේ රැඳී සිටිනවා. බැසිල් රාජපක්ෂ මැතිතුමා රටින් පිටව යාමට පැමිණි අවස්ථාවේ දී ආගමන සහ විගමන දේපාර්තුමෙන්තු නිලධාරින් සිය රාජකාරි කටයුතු වලින් පවා ඉවත්ව විරෝධතා දැක්වීම නිසා රටින් පිටවීමට නොහැකි වෙලා. හොරකම් කරලා, දූෂණ සිදු කරලා රටෙන් හොරෙන් පැනලා යන්න හදනවා. අපි ඒවාට දුක් විඳින්න ඕන. මේ නිසා පාලන කටයුතු පවුල් පාලනයෙන් තොර විය යුතුයි. අපි සියලු දෙනාම ඔය පවුල්වලට අඩු වැඩි වශයෙන් කඩේ ගිහිල්ලා තියෙනවා. පවතින පාලන ක්‍රමයට අකමැති නිසා අරගලේ සිටින තරුණ දරුවෝ අලුත් ක්‍රමයක් සකස් කරන ලෙස ඉල්ලීම් කරනවා. අරගලයේ මුවාවෙන් බලය ලැබෙනවානම් එයත් භාර ගන්න කැමැත්ත දක්වනවා. අරගල කරන දරුවන්ගේත්, දෙකෝටි විසි ලක්ෂයකගේත් සිතුම් පැතුම් ඉෂ්ඨ වෙන්න ඕන. අරගලයේ දරුවෙකුගේ ඔළුවට වෙඩි තබා තිබුණා. ලංකාවේ පවතින මේ තත්ත්වය මුළු ලෝකයම දිහා බලාගෙන සිටිනවා. ඊට විරුද්ධව ඇමරිකානු තනාපතිනිය තම අදහස් ඉදිරිපත් කර තිබුණා. ඔබතුමන්ලාටත්, මටත් ජූලි 13 වෙනිදාගෙන් පසුව ගමේ ඉන්න බැරි තත්ත්වයක් උදාවෙන්න පුළුවන්. එය බරපතල තත්ත්වයක් වන අතර වෘත්තීය සමිති එකමුතුව ජූලි 13 වෙනිදාගෙන් පසුව ජනාධිපතිතුමා සිය ධූරයෙන් ඉල්ලා අස් නොවුණොත් දැවැන්ත හර්තාලයකට සූදානමින් සිටින බව මාධ්‍ය වෙත ප්‍රකාශ කර තිබුණා. රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන කටයුතු අමාත්‍යාංශය වෙත යෝජනාවලියක් ඉදිරිපත් කර තිබුණා. එහි හත්වැනි අංකය යටතේ පළාත් පාලන ආයතන විසුරුවා හැරිය යුතු බව ඉදිරිපත් කර තිබුණා. රජය විසින් තීරණ ගත යුතුයි. නැතහොත් අපිටත් ඊට මුහුණ දෙන්න සිදු වෙනවා. වත්මන් වැඩබලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවසට ගිනි තැබුවා යන මතයට මා විරෝධය ප්‍රකාශ කරනවා. සිරස ජනමාධ්‍ය වේදීන්ට පහරදීම සම්බන්ධයෙන් විරෝධතාවය ප්‍රකාශ කරනවා. මාධ්‍ය වේදීන්ට පහර දුන් අවස්ථාවේ දී රනිල් වික්‍රමසිංහ මැතිමාගේ නිවස ගිනි තැබීම වළක්වාලීමට තිබුණා. එස්.ටී.එෆ්. නිලධාරින් 300, ක් 400 ක් ආරක්ෂාව සඳහා රාජකාරියේ යෙදී සිටියදී ගිනි තබන්නන් ඇතුල් වුණේ කෙසේද? රජය තුලින්ම කුමන්ත්‍රණ සිදු කරන බව පැහැදිලිවම පේනවා. එහි තිබුණු ද්‍රව්‍ය ඉවත් කර ගිනි තබා තිබෙනවා. තව දින කිහිපයකින් එහි සත්‍ය එළි වෙයි. රජය තුලින් ක්‍රියාත්මක වූ උපක්‍රමශීලි වැඩ පිළිවෙලක් බව මනාව පැහැදිලි වෙයි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති අකිල සාලිය එල්ලාවල මැතිතුමාගේ නිවස, බලංගොඩ නගර සභාවේ සභාපතිවරයාගේ නිවස, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිවස ගිනි තබා විනාශ කළා. එසේ ගිනි තැබූ අය මාගේ නිවස ගිනි තැබීමටත් පැමිණියා. මෙය අරගලකරුවන් විසින් කල ක්‍රියාවක් බව ඔබතුමන්ලා විශ්වාස කරනවාද? එදින මගේ නිවස ඉදිරිපිටට බයිසිකල් 06 ක් 07 ක් පැමිණියා. බලංගොඩ සභාපතිවරුන්ගේ නිවෙස්වලට ගිනි තැබූ අය මගේ නිවස ගිනි තැබීම සඳහා පැමිණි බව මගේ දියණිය කතා කරලා කිව්වා. ඒ අවස්ථාවේ දී මම බිරිඳ සමඟ නිවස වසා දමා පාරෙන් එහා පැත්තට වෙලා සිටි අතර බයිසිකල් වලින් නාඳුනන පුද්ගලයන් පැමිණියා. මේ සිද්ධීන් සඳහා මෙරට නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් නායකත්වය දුන්නා. ඉදිරියේ දී එම තොරතුරු වාර්තා වෙයි. 2002 වර්ෂයේ දී මැතිවරණ ක්‍රියාවලියේ දී බලංගොඩ ආසනයේ තරුණයෙක් වෙඩි වැදී මැරුණත් බලංගොඩ දේශපාලනඥයෙකුගේ නිවාස මෙලෙස ගිනි තබා නැහැ. දිවංගත මොහාන් එල්ලාවල මැතිතුමාගේ ආසනයේ ගෙවල් ගිනි තබලා. වරුණ මැතිතුමා සිය සහෝදරයා යවලා වාහන මඟින් මාර්ගය හරස් කර එම ඛෙදනීය අවස්ථාවන් වළක්වාගෙන තිබෙනවා. රත්නපුර ආසන 08 ක් පවතිනවා. වෙනත් එකම ආසනයක මන්ත්‍රී නිවසකට, සභාපතිවරයෙකුගේ නිවසකට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නිවසකට ගිනි තබලා නැහැ. සංවිධායකවරු ලෙස වැඩ කල විපක්ෂයේ අය ආණ්ඩු පක්ෂයේ අයගේ නිවාස ආරක්ෂා කළා. බලංගොඩ ආසනයේ අයගේ නිවාස ගිනි තියන්න එපා කියන්න කෙනෙක් හිටියේ නැහැ. බලංගොඩ ආසනයේ ගෙවල් තැබීම නතර කරන්න දේශපාලන අධිකාරියේ මැදිහත් වී වැඩ කරන්න කෙනෙක් හිටියේ නැහැ. විපක්ෂයේ අය ගෙවල් ගිනි තියන්න ඉදිරිපත් වුණේ නැහැ. අවුරුදු 05 ක් සඳහා බලයට පැමිණි අය වසර 2 ½ න් යන්න වෙලා. මේ අනුව සදාකාලිකව දේශපාලනයේ නිරත වෙන්න බැහැ. මේ අවස්ථාවේ සභා ගර්භයේ රැඳී සිටින ලේකම්තුමියත්, නිලධාරිතුමියත් වසර 60 ක් දක්වා රාජ්‍ය සේවයේ රැඳී සිටියත්, මහජන නියෝජිතවරුන් වන අපිට තනතුර දාලා යන්න වෙනවා. විනයක් හික්මීමක් ඇතුව දේශපාලන කටයුතු වල නිරත වියයුතුයි. පසුපෙළ සිට ජනතාවට සහය දක්වන අතර ලැබෙන දීමනාව මඟින් ජනතාවට සේවය සලසනවා. මා විසින් ඊයේ දිනත් දුප්පත් ජනතාව වෙනුවෙන් ආහාර සහන මලු ලබා දීමට ක්‍රියා කළා. රත්මලවින්න කොට්ඨාසයේ

මන්ත්‍රීවරු එකමුතු වී රු. 75000.00 ක පමණ මුදලක් එකතු කරගෙන දුප්පත් ජනතාවට ආහාර සහනාධාර මලු ලබා දීමට කටයුතු කරමු. මන්ත්‍රීවරු එකඟතාවය පල කරන්නේනම් මම ද ඒ සඳහා සහයෝගය ලබා දෙනවා.

පළාත් පාලන ආයතන විසුරුවා හැරීමේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
ඒ අනුව පළාත් පාලන ආයතන විසුරුවා හැරීමේ යෝජනාවට විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
ජූලි මස 09 වෙනිදා සිදු අරගලය දිනයේ දී ජනාධිපතිතුමා හැඟීමකින් තොරව කටයුතු කරනවා දක්නට ලැබුණා. දේශපාලනික වශයෙන් නොව රටේ තත්ත්වය සලකා බලා එතුමාට ජනාධිපතිධූරයෙන් ඉවත් වීමට තිබුණා. අරගලයට අපි සහයෝගය ලබා දෙනවා. අරගලයේ සිටින්නේ බුද්ධිමත් අය. හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, හිටපු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා අරගලය නිසා සිය තනතුරු වලින් ඉවත් වුණා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා හොඳ දේශපාලන නායකයෙක්. අරගලයට මුවාවෙන් ගිනි තබන කණ්ඩායම විසින් එතුමාගේ නිවස ගිනි තබා විනාශ කළා. වගකිව යුතු පුද්ගලයන් විසින් නීතිය ක්‍රියාත්මක කල යුතුයි. එතුමාගේ නිවස ගිනි තැබීම සම්බන්ධයෙන් එ.ජා.ප. පක්ෂයේ සභාව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන් 06 දෙනා වෙනුවෙන් විරෝධතාවයත්, කණගාටුවත් ප්‍රකාශ කරනවා.
නළුවෙල වෙල් යාය සඳහා ගමන් කිරිමට මාර්ගයක් සකසා දෙන ලෙසට පසුගියවර සභා වාරයේ දී ඉල්ලීමක් කළා. එම ප්‍රදේශයේ ගොවි ජනතාවට ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා වෙත ඉල්ලීමක් කරන ලෙස මා ඔවුන් දැනුවත් කළා. ඒ අනුව එම මාර්ගය සකසා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. එහි මාර්ග සංවර්ධන අධිකාරිය සතුව රක්ෂිත භූමියක් පවතින අතර ඒ බව රත්මලවින්න අඩවිවන නිලධාරි කාර්යලාය හා සාකච්ඡා කිරීමෙන් අනතුරුව මා දැන ගත්තා. එම වෙල් යායට පිවිසීමට මාර්ගයක් සකසා දෙන ලෙස ගෞරවනීය ලෙස ඉල්ලා සිටිනවා.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
ප්‍රාදේශීය සභාවේ අලුත්නුවර ජල යෝජනා ක්‍රමය තුලින් සාමාන්‍ය පරිදි දින තුනෙන් තුනට ජල පාරිභෝගිකයන්ට ජලය බෙදා හිරීමේ ක්‍රියාවලිය සිදු කළත් මේ දිනවල දින 12 කින් ජලය ලැබී නැහැ. ජූනි 30 වෙනිදා ජලය බෙදා දුන් පසුව අදවන තුරු ජලය ලැබී නැහැ. මේ පිළිබඳව ජල කම්කරු මහතුන් දෙදෙනා දැනුවත් කළා. එහෙත් දිගින් දිගටම මෙසේ සිදු වන්නේනම් ඔබතුමා මැදිහත් වී මේ පිළිබඳව විමසා බලන්න.

රටේ වාතාවරණයත් සමඟ වසර 10 ක් බලයේ රැඳී සිටින්න පැමිණි, පාර්ලිමේන්තුවේ 2/3 බලය ලබා ගත්, හැටනම ලක්ෂයක ජන වරමක් දිනා ගත් ජනාධිපති කෙනෙකුට හූ හඬ මැදින් ඉවත්ව යන්න වෙලා. බලයට පැමිණි නායකයන් ක්‍රියා කල ආකාරය, ඔවුන්ගේ ක්‍රියා පිළිවෙතට උත්තර දෙන්න ජනතාව පෙළ ගැසී සිටිනවා. මේ සභාවේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු වසර 10 ක් යනතුරු අදහස් ප්‍රකාශ කරන බව ප්‍රකාශ කළා, උදම් අණුවා, ආඩම්බරයෙන් කතා කළා. එහෙත් වසර 2 ½ ගත වූ අවස්ථාවේ දී ජනවරම අනෙක් පැත්තට හැරිලා. කවුරු බලයේ සිටියත්, පුටුවේ සිටියත් ජන මතයට හිස නමන්න වෙනවා. එය රටේ ජනමතයයි. මිනිස්සු හරි මතයට ඇවිල්ලා. මැයි මස 09 වෙනිදා හිටපු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගෙදර යැව්වා. ජූනි 09 වෙනිදා මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා ගෙදර යැව්වා. ජූලි 09 වෙනිදා ජනාධිපති ගොඨාභය රාජපක්ෂ මැතිතුමා ගෙදර යවන්න මිනිස්සු කටයුතු කළා. මින් ඉදිරියේ දී කවුරු බලයට පැමිණියත් කුමන පක්ෂයක් ආණ්ඩු පිහිටෙවුවත් වැරදි පාලනයට ජනතා සමාවක් ලැබෙයි කියා මා සිතන්නේ නැහැ. මිනිස්සු බලාපොරොත්තු නොවන ආකාරයට පාලනය ගෙන යාමෙන් ඒ සියල්ලටම මේ පිළිතුර ලැබෙනවා. කවුරු බලයට පැමිණියත් වැරදි වැඩ කරන්න ලැබෙන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවස ගිනි තැබීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනවා. බලංගොඩ නගරයෙත් මේ සිදුවීම සිදු වුණා. ගෙවල් ගිනි තැබීම අනුමත කරන්නේ නැහැ. සාමකාමී අරගලයට එල්ලවුණු කළු පැල්ලමක්. අරගලකරුවන් එසේ කළා යැයි අපි විශ්වාස කරන්නේ නැහැ. යම් සංවිධානාත්මක කණ්ඩායමක් විසින් ගිනිතැබීම් ක්‍රියාත්මක කරන්න ඇතැයි සිතන අතර මේ අවස්ථාවේදී මෙන්ම මීට පෙර ඇති වූ ගිනිතැබීමේ අවස්ථාවන් සඳහාත් රටේ නීතිය ක්‍රියාත්මක කල යුතුයි. නිවැරදි තීරණ ගත යුතුයි. නැතහොත් වෙනත් පිරිසකට චෝදනා එල්ල වෙනවා.

රටේ පවතින ආර්ථිකමය වශයෙන් අර්බුධකාරී තත්ත්වයත් සමඟ අප නියෝජනය කරනු ලබන සභාව පමණක් නොව මුළු රටේම ප්‍රාදේශීය සභාවන් නඩත්තු කිරීම සඳහා විශාල වියදමක් දරණ බවත්, එය රටට දරාගත නොහැකි බවත් හිටපු සභාපති ඉන්දු ගුණතිලක මැතිතුමා ප්‍රකාශ කළා. එම යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බව මගේ මතයයි. අපිත් රට වෙනුවෙන් යමක් කරන්න ඕන. සභාව විසුරුවා හැරීම හෝ කොමසාරිස් පාලනය යටතට පත් කිරීම සුදුසුයි. මන්ත්‍රීවරු සාමූහිකව එම තිරණයට එන්නේනම් හොඳයි. මෙය රටට බරක්. ඉදිරි ආණ්ඩුවෙන් පළාත් පාලන ආයතන විසුරුවා හරිනු ඇතැයි බලාපොරොත්තු වන අතර, මේ අවස්ථාවේ දී පාට පක්ෂ ජාති භේදයකින් තොරව පො.ජ.පෙ. ට ඡන්දය දුන් සහ නොදුන් පිරිස් වෙනත් පක්ෂ වලට ඡන්දය දුන් පිරිස් රටේ උද්ගතව පවතින ප්‍රශන්යට පිළිතුරු සෙවීමටත් රාජපක්ෂවරුන් පලවාහැරීම සඳහා පාරට බැස්ස සියලු දෙනාට ස්තූතිය ප්‍රකාශ කරනවා. කුමන පක්ෂය කලත් වැරද්ද වැරද්දමයි. ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් පවා කොළඹ පැවැති අරගලයට පැමිණ සිටියා. මෙම සභාවේ නොවුණත් බලංගොඩ සභාවෙන් පැමිණ සිටියා. නිවැරදි තීන්දු තීරණ ගැනීමට මන්ත්‍රීවරුන්ට ශක්තිය ධෛර්ය පතමි. ඉදිරියේ දී පත්වන ආණ්ඩුව ජනතා වාදී ආණ්ඩුවක් වේවා. මන්ත්‍රීවරුන්ට නිවැරදි තීන්දු තීරණ ගත හැකිනම් මීට වඩා රට සංවර්ධනය කරන්න පුළුවන්.

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
ඉන්ධන නොමැතිවීම හේතුවෙන් මොරහැල උඩවෙල අමුපිටිය මාර්ගයේ සංවර්ධන කටයුතු මේ වන විට නතර වෙලා. අවස්ථා දෙකක දී ලිපිගොණු සකසාගෙන මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව කටයුතු කරන ඉංජිනේරුතුමා සමඟ ආණ්ඩුකාරතුමා මුණගැසීමට ගියා. මෙම ව්‍යාපෘතිය ලෝක බැංකු ආධාර යටතේ ඩොලර් ලැබෙන ව්‍යාපෘතියක්. මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට අවශ්‍ය ඉන්ධන ඩිපොවෙන් ඉල්ලුම් කළා. මේ පිළිබඳව සාකච්ඡා කිරිම සඳහා පළමු දිනයේ පැවතුණු සාකච්ඡාවට කොට්ඨාසය නියෝජනය කරන මන්ත්‍රීවරයා ලෙස මා සහභාගී වුවත් දෙවෙනි දිනයේ දී බස්රථය ප්‍රමාදවී යාම නිසා සාකච්ඡාව අවසන් වී තිබුණා. කොන්ත්‍රාත්කරුවන්ට ඩීසල් ලබා දීමට හැකියාවක් නොමැති බව පවසා ආපසු එවා තිබුණා. එදින එතුමා පැමිණ තිබුණේ අනුරාධපුරයේ සිටයි. ඒ.බී.සී. යොදලා අවසන් වී ඇති අතර කාපට් කිරිමට පමණක් තිබෙන නිසාත්, බල ප්‍රදේශයේ මාර්ගයක් සංවර්ධනය කරන නිසාත්, මෙම ව්‍යාපෘතිය දෙසැම්බර් මාසයෙන් අවසන් වන නිසාත්, මෙම ව්‍යාපෘතිය ලංකාවට ඩොලර් එන ව්‍යාපෘතියක් නිසාත්, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් නිසාත්, ගමට මාර්ගය සංවර්ධනය වීම සිදුවන නිසාත් ඉන්ධන ලැබුණොත් මාර්ගය සංවර්ධනය කිරීමට හැකියාව පවතින නිසාත්, ආණ්ඩුකාර තුමාට මීට මැදිහත් වීමට හැකියාව පවතින බැවින් මෙම මාර්ගයේ ඉදිරි සංවර්ධන කටයුතු නිමා කිරීම පිළිබඳව අවධානය යොමු කරන්න. ප්‍රාදේශීය ලේකම්තුමියට කතා කළාම මන්ත්‍රීතුමා මහන්සි නොවන ලෙසත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසන බවත් ප්‍රකාශ කළා. මෙහි සේවය කලේ බහුතරයක් ගම්වාසීන් වුවත් ඔවුන්ට වැටුප් ගෙවා නැහැ. ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා ඇති බැවින් ගිලිහී යාමට මත්තෙන් ඉන්ධන යොදවා මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.
දුගී දුප්පත් ගම්වාසීන් ආහාර සඳහා කොස් ගෙඩියක් සොයමින් ගම වටේ ඇවිදිනවා. මේ නිසා මා විසින් පෞද්ගලික මුදලින් ආහාර මළු සකස් කර ලබා දීමට කටයුතු කළා. එලෙස රට ආර්ථික වශයෙන් අර්බුධාකාරී තත්ත්වයකට පත්ව ඇති අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා හොඳ යෝජනාවක් ඉදිරිපත් කළා. එම යෝජනාව අපි ඉදිරියට ඉදිරිපත් කරමු. විසුරුවා හැරීමට යම් කාලයක් ගත වන්නේ නම් එම කාලය තුල අපි දුගී පවුල් තෝරාගෙන ආහාර මළු ලබා දීමට පියවර ගනිමු. කොට්ඨාසයේ සිටින ගම්වාසීන් බලා ගැනීමට පියවර ගනිමු. රජයේ අසාර්ථක ආර්ථික තත්ත්වය නිසා රු. 5000.00 ක මුදලකින් ෂොපින් මල්ලක් පිරෙන්න ආහාර ද්‍රව්‍ය ලබා ගන්න බැහැ. අරගලය ඇති වුණේ මේ නිසා බව අප පිළිගත යුතුයි. රජය විසින් ක්‍රියාත්මක කළ 18,19,20 යන සංශෝධන නිසාත්, එම සංශෝධන වල පැවැති දුර්වලතා නිසාත් අසාර්ථකභාවයට හේතුවුණා. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ඉවත් කළා. හිතුමතේට පාලනය ගෙන ගියා. අදූරදර්ශී හිතුවක්කාරී මෙම ක්‍රියා පිළිවෙත නිසා ජීවන වියදම අහස උසට නැංගා. පාසැල් අධ්‍යාපනය නතර වෙලා. වාහන ගමන් කිරීමට හැකියාවක් නැහැ. අපේ යුගය දැන් අවසන් වෙමින් පැවතියත් අනාගත දරුවන්ට යහපත් අනාගතයකට මාර්ගය විවර වන්නේනම් කඩිනමින් සර්ව පාක්ෂික පාලනයක් මඟින් වසරක් තුලදී අපිට ලබා දිය හැකි දායකත්වය ලබා දෙමු. දූෂණය අල්ලලා දෙන කෙනා වැරදියි. එවැනි දේශපාලන වාතාවරණයක් නැවත පැමිණීම හොඳ නැහැ. හොඳ වාතාවරණයක් ලැබෙයි කියා බලාපොරොත්තු වෙනවා.

(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා අදහස් දක්වමින්,
එ.ජා.ප. නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවස ගිනි තබා විනාශ කිරීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන අතර එම ක්‍රියාව හෙළා දකිනවා.
අඩු ආදායම්ලාභීන්ට සහනාධාර බෙදා දීමේ දී අමුපිටිය වසමේ කිහිප දෙනෙකුට සහනාධාර නොලැබුණ බව මා වෙත දැනුම් දුන්නා. ඒ පිළිබඳව සොයා බලා ඔවුන්ට සහනාධාර ලබා දීමට ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.
2018 වර්ෂයේ දී මහජන නියෝජිතවරයෙක් ලෙස මැතිවරණයට ඉදිරිපත් වීමේ දී කුඩා දරුවන් වෙනුවෙන් පරිත්‍යාගයන් සිදු කරන බවට වූ මාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පරිදි මා හට ලබාදෙන මන්ත්‍රී දීමනාව දුප්පත් ජනතාවගේ සේවය සඳහා පරිත්‍යාග කිරීමට කටයුතු කරන බව සතුටින් දන්වා සිටිනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
(x). නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිම.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය අසනීප වී ඇති බැවින් අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දුරකතනය මඟින් දැනුම් දී තිබෙනවා. එබැවින් එතුමාගේත් සහ එතුමියගේත් නිවාඩු අනුමත කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.එම්.සමන්ත ජයසිංහ මැතිතුමාගේ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමාගේ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමාගේ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
ගල්ලෙනකන්ද, වසමේ ජනතාව සහනාධාර ලබා ගැනීමට දුෂ්කරතා මැද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණි බව සඳහන් කළා. ඒ බව මමත් දුටු නිසා දුෂ්කරතාවය පිළිබඳ අවබෝධ වුණා. එහෙත් ඉන්ධන හිඟතාවය නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මෙම සහනාධාර ගෙන්වා ගැනීමේ දී සභාවේ වාහන පහසුකම් මා වෙතින් ඉල්ලුම් කළා. එහෙත් ඉන්ධන නොමැතිව මා වාහනය පමණක් ලබා දීමට කටයුතු කළා. වසම් මට්ටමින් සහනාධාර බෙදා දෙන ලෙස මා දැනුම් දීමට කටයුතු කරනවා. එහෙත් ඉන්ධන හිඟතාවය නිසා ගැටලුවක්. අමුපිටිය වසමේ සහනාධාර ලැබිය යුතු අඩු ආදායම්ලාභීන්ට සහනාධාර ලැබී නැති බවත්, වසර 05 ට අඩු දරුවන්ට කිරි පැකට් ලබා නොදීම පිළිබඳව සඳහන් කළා. අභියාචනා සලකා බලා එම සහනාධාර ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් තුමිය දැනුවත් කිරීමට කටයුතු කරනවා.
අඩු ආදායම්ලාභීන්ට රු. 5000.00 දීමනාව බෙදා හැරීම සඳහා ග්‍රාමීය කමිටුවක් පිහිටුවා තිබුණු අතර එහි දේශපාලන නියෝජිතයින් ද සාමාජිකත්වය දැරුවා. අවශ්‍ය අවස්ථාවල් වලදී වඩාත් නිවැරදි තීරණ ගැනීමට එය පිටුවහලක් වුණත් මෙවර සහනාධාර බෙදා දීමේ දී මහජන නියෝජිතවරුන් සහභාගී නොවීම ගැටලුවක්. අඩුආදායම්ලාභීන්ට මෙම සහනාධාරය ලබා දෙන ලෙසත්, එහිදී පවතින පහසුකම් යටතේ ග්‍රාම නිලධාරී කාර්යාලය, සමෘද්ධි සංවර්ධන නිලධාරී කාර්යාලය මඟින් සහනාධාර බෙදා හැරීමේ ක්‍රමවේදයක් සලසන ලෙසත් දන්වා යැවීමට කටයුතු කරනවා.
මහජන නියෝජිතවරුන් ලෙස තම කෝට්ඨසවල ජනතාවට සමෘද්ධි සහනාධාරය ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමියගෙන්, සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමියගෙන් ඉල්ලීම් කළා. එම නිසා එම පොරොත්තු ලේඛනය 100 % ක් නිවැරදි නොවීම ගැන දේශපාලන අධිකාරිය වශයෙන් සභාපතිවරයා ලෙස මා ඇතුළු සියලු මන්ත්‍රීවරුන් අඩු වැඩි වශයෙන් වගකීම දැරිය යුතුයි. සහනාධාර ලබා දෙන ලෙසට අභියාචනා ඉදිරිපත් කරන ලෙසට එම අඩුආදායම්ලාභීන් දැනුවත් කරන්න. එම අභියාචනා සලකා බලා සහනාධාර ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කිරීමට පියවර ගන්නවා.

එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා නැගී සිටිමින් සමෘද්ධි සහනාධාර ලබාදීමේ දී තම කොට්ඨාසය තුල ජනතාවට සහනාධාර ලබා දෙන ලෙස තමා ඉල්ලීම් නොකළ බැවින් ඒ

සඳහා තමා ඇතුළත් නොවන බව ප්‍රකාශ කරන ලද අතර ගරු සභාපතිතුමා විසින් ද එම ප්‍රකාශය සත්‍ය බව ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා නැවතත් අදහස් දක්වමින්,
පොරොත්තු ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේ දී අඩු ආදායම්ලාබී නොවූ එහෙත් වෙනත් ක්ෂේත්‍රවල රැකියා අහිමි වීම හේතුවෙන් බොහෝ පිරිසක් අද අඩුආදායම්ලාබීන් බවට පත් ව සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
සංවර්ධනය කරන ලද මෙම මාර්ග 05 පිළිබඳව හා එම මාර්ගවල ඉදිරි කටයුතු සාකච්ඡා කිරීම සඳහා රත්නපුර දිස්ත්‍රික් කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමා විසින් කමිටුවක් පත් කළා. එහෙත් ඔබතුමන්ලාගේත්, සභාපතිවරයා ලෙස මගේත්, සමිති වලත් ඉල්ලීම් නොසලකා හැර කටයුතු කර තිබුණත්, වත්මන් තත්ත්වය අනුව එක් අවස්ථාවක් ලැබී තිබෙනවා. පරීක්ෂණ කටයුතු මඟින් වාර්තා දෙකක් ඉදිරිපත් වෙලා තිබෙන බැවින් එම වාර්තා දෙක පදනම් කර ගනිමින් ස්වාධීන මණ්ඩලයක් විසින් ස්වාධීන පරීක්ෂණයක් සිදු කරන ලෙස දන්වා යවනවා.

එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා නැගී සිටිමින් මෙම මාර්ග 05 සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කල හඬ පටිගත කිරීම් පවා තිබෙන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා නැගී සිටිමින් කමිටුවක් පත් කළත් පරීක්ෂණ සිදු කර ඇත්තේ එක් පුද්ගලයෙකු විසින් බවත් ප්‍රකාශ කරන ලදි.

නැවතත් ගරු සභාපතිතුමා ඒ පිළිබඳව අදහස් දක්වමින්,
මෙම මාර්ග 05 පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සභාපති ලෙසත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කල ආයතනය ලෙසත්, ප්‍රාදේශීය සභාව මාර්ග සම්බන්ධව වගකිව යුතු ආයතනය ලෙසත් නම් කර කමිටුවක් පත් කරන ලෙස රත්නපුර දිස්ත්‍රික් කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමා යෝජනා කළා. නමුත් එම යෝජනාව ක්‍රියාත්මක වුණේ නැහැ.

අගමැතිතුමාගේ නිවස පමණක් නොව රජ්‍ය දේපල හා රාජ්‍ය නොවන දේපල, පොදු දේපල විනාශ කිරීම හෙළා දකින අතර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවක් නොවන බැවින් කුමන පක්ෂය වුවත්, කවුරු කළත් එය වැරදියි. බලයට පැමිණ සිටින දේශපාලනඥයන් හොඳ නැත්නම් ඊ ළඟ මැතිවරණයේ දී සියලු දෙනාම ගෙදර යවන්නත්, අලුත් අය කැඳවන්නත් හැකියාව පවතින අතර ඒත් ඊට සුදුසු අවස්ථාව එනතුරු සිටිය යුතු අතර බලෙන් ඉවත් කරන්න ක්‍රමයක් නැහැ. බලයෙන් පහ කිරීමේ ක්‍රමය චණ්ඩි වැනි පුදගලයන් 10 ක් 15 ක් පැමිණ ගෙවල් ගිනි තැබීම නොවෙයි. එහෙත් අරගලය නිසා රාජ්‍ය පාලනය හා නීතිය විනාශ වීම කණගාටුදායකයි. රටේ නැතිවන නීතියේ ආධිපත්‍ය හා සම්ප්‍රධායන් හදාගන්න බැරිවෙයි. වසර ගණනාවක් තිබුණු සම්ප්‍රදායන් නැති වුණු දවසට දුක හිතෙයි. මෙමඟින් තව තවත් රට විනාශ වෙන එක පමණයි සිදු වන්නේ. ජනාධිපතිවරයාගේත්, අගමැතිවරයාගේත් මන්දිර හොරා කාළා. ජනාධිපතිතුමා ඉතාමත් හොඳින් රට පාලනය කළා කියන්නේ නැහැ. පක්ෂ විපක්ෂ කාටත් වග නොකීම ගැන රජය වගකියන්න ඕන. හොරු කාටත් මෙරට නීතිය අනුව නිත්‍යානුකූලව ආකාරයට දඬුවම් දිය යුතුය. පක්ෂ විපක්ෂ කාටත් නීතිය ක්‍රියාත්මක විය යුතුයි. සභාවෙන් සත 05 ක් හොරකම් නොකළ සභාපතිවරයෙක් ලෙසින් මම බය නැතිව සභාපති ධුරය අවසන් වූ දිනයක ඉවත්ව යනවා. පොහොර ලබා නොදීම නිසා මාද රජය ගැන කළකිරුණා. මා ඒ ගැන කණගාටුව ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමාගේ අදහසු දැක්වීම අනුව,
ප්‍රාදේශීය සභා විසුරුවා හැරිය යුතු බවට එතුමාගේ පෞද්ගලික මතය ඉදිරිපත් කළා. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස ප්‍රාදේශීය සභා විසුරුවා හැරිය යුතු මතයේ මමත් සිටිනවා. මාගේ පෞද්ගලික මතයද එයමයි. ජනතාවට සේවය කරන්න බැරිනම් මේ තනතුරේ රැඳී සිටීමෙන් පලක් නැහැ. සභාවෙන් සේවයක් නොකෙරෙන්නේනම් මෙය විසුරුවා හැරීම හොඳයි. එතුමා අද දිනයේ සභාවට පැමිණ දීමනාව

පමණක් රැගෙන නොයා සභා ගර්භයේ රැඳී සිටිමින් මහජනයා වෙනුවෙන් වචන කිහිපයක් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් මම එතුමාට ගෞරවනීය ස්තූතිය පිරිනමනවා. වසර 04 ක් ගෙවුණු පසුව, මෙය විසුරුවා හරින්න ඕන, ජනතාවට සේවය කරන්න ඕන, මුදල් ඉතිරි කරන්න ඕන කියනවාට වැඩියෙන් අපට ජනතාට වසර 04 ක කාලය තුල සේවය කරන්න තිබුණා. විපක්ෂය නියෝජනය කරන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමා, යන අය අතර දේශපාලනික වශයෙන් පෞද්ගලික ආරවුලක් නැහැ. දේශපාලනය යනු ලක්ෂ දෙක තුනක ප්‍රතිපාදන යටතේ මාර්ග සංවර්ධනය කිරීම පමණක් නොවෙයි. බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය කිරීම, වීථි පහන් නඩත්තු කිරීම, ශ්‍රී ලංකා ගමනා මණ්ඩලයෙන් බස් ධාවන නොකිරීම පිළිබඳව පවතින ගැටළු සාකච්ඡා කිරීම, සමෘද්ධි දීමනා ලබා දීම හා සම්බන්ධව පවතින ගැටළු මන්ත්‍රීවරුන් මාර්ගයෙන් ඉදිරිපත් කරනවා. ජනතාවට කතා කරන්න බැරි ප්‍රශ්න සාකච්ඡා කොට විසඳුම් ලබා දීමට මන්ත්‍රීවරුන් තෝරා පත්කර එවා තිබෙනවා. එහෙත් සභාව විසුරුවා හැර නීත්‍යානුකූලභාවයක් ස්ථාපිත කරන තුරු බල ප්‍රදේශයේ ජනතාවත්, පක්ෂය නියෝජනය කරන ඔබතුමන්ලාත් මට ලබා දුන් වරම අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ සිට සේවය කරනවා. ගෙවල් ගිනි තියනවාට බියෙන් සභාපති ධුරය දාලා පැනලා යන්නේ නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමියගේ අදහස් දැක්වීම අනුව,
අමුපිටිය, හෙලවත්ත, කීණගහඇල්ල ප්‍රදේශයේ ජනතාවගේ දෛනික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා දිනකට දෙවතාවක් කීණගහඇල්ල මාර්ගයට බස් රථයක් ධාවනයේ යොදවන ලෙසට ඩිපෝ අධිකාරි වෙත දන්වා යවීමට කටයුතු කරනවා.
මෙම අවස්ථාවේ දී, එම මාර්ගයේ පෞද්ගලික බස් රථයක් යෙදවීමේ හැකියාවක් පවතින්නේදැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා නැගී සිටිමින් විමසන ලද අතර පෞද්ගලික බස් රථයක් ධාවනයේ යෙදවීම පිළිබඳ නීතිමය බලතල ප්‍රාදේශීය සභාව සතුව නොමැති බව ප්‍රකාශ කරමින් එහෙත් මෙම මාර්ගයට පෞද්ගලික බස් රථයක් ධාවනයේ යෙදවීම සඳහා මාර්ග අවසරපත්‍ර ලබා ගැනීම පිළිබඳව ආණ්ඩුකාරතුමා වෙත දන්වා යැවීමට හැකියාවක් පවතින බැවින් ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලීම් කරන ලෙස දැනුවත් කරන්න.

කෘෂිකර්ම විෂයභාර අමාත්‍යතුමා ඉල්ලා අස්වීම නිසා පොහොර බෙදාහැරීම සම්බන්ධ වගකීම දරන්න කෙනෙක් නැහැ. කාට හෝ වගකීම භාර දෙනතුරු ධුරයේ වැඩ බලන බව රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රකාශ කළා. ඒ සම්බන්ධයෙන් ස්තූතිය පුද කල යුතුයි. හිටපු අමාත්‍යවරුන් නව අමාත්‍යවරයෙකුට වගකීම භාරදෙන තුරු ධුරයේ වැඩබලන්න වගකීමක් තිබෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා නැවතත් නැගී සිටිමින් අදහස් දක්වමින්,
රටතුල උද්ගතව තිබෙන ආර්ථික අර්බුදය හේතුවෙන් ඊළඟ මැතිවරණය පවත්වන තුරු ලංකාවේ සියලු පළාත් පාලන විසුරුවා හැරිය යුතුය මතයේ සිටිමින් අදහස් ප්‍රකාශ කළා. ජනතාවට සේවයක් වීම පිණිස මෙය විසුරුවා හැරිය යුතුයි.

ගරු සභාපතිතුමා නැවතත් අදහස් දක්වමින්,
මෙම සභාව නියෝජනය කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා ජනතාවගෙන් උපයනු ලබන බදු මුදලින් වසර 4 ½ ක් තුල එකම වචනයක් හෝ කතා නොකළත් අද දින ජනතාව වෙනුවෙන් එක් වචනයක් හෝ කතා කළා. ඒ පිළිබඳවයි මා පැහැදිලි කළේ. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පළාත් සභා, පාර්ලිමේන්තු යන ආයතන නොමැතිව වුවත් ලොවපුරා පැතිරුණු කොරෝනා වසංගත තත්ත්වය පාලනය කිරීමට කඩිනමින් කොරෝනා මර්ධන එන්නත් ලබා දෙමින් ඒ තත්ත්වය මැනවින් කළමණාකරණය කළා. අද අප මෙහි රැඳී සිටින්නේ කඩිනමින් එන්නත් ලබා දුන් නිසයි.
එතුමාගේ නිවස ගිනි තැබීමට බයිසිකල් පැමිණි බව ප්‍රකාශ කළා. එහෙත් මට ඒ බය නැහැ. හේතුව දේශපාලනික ප්‍රතිවිරුද්ධව සිටින දේශපාලනඥයින් පවා මා ආරක්ෂා කිරීමට පෙළ ගැසී සිටියා. මාගේ දේශපාලනය එයයි. ජනතාවටත්, මහජන නියෝජිතවරු ලෙස අපෙන් රටට සේවයක් නොවන්නේනම් මෙය

විසුරුවා හැරිය යුතුයි. මෙම සභාවාරය විසුරුවා හරින දිනයෙන් පසුව මා සභාපති ධූරයෙන් ඉවත් වන්නේ සභාවේ දේපළ හොරකම් කළා යැයි චෝදනා නොලැබූණු සභාපතිවරයෙක් ලෙසයි.

රාජපක්ෂවරු හොරකම් කලබව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා ප්‍රකාශ කළා. මෙරට දේපල හොරකම් කර ඇත්නම් නිත්‍යානුකූල කටයුතු කර නැවත එම දේපල පවරා ගැනීමට කටයුතු කළ යුතුයි. මන්ත්‍රී දීමනා ලබා ගැනීම සහ නොගැනීම පිළිබඳව සභාවේ කතා කිරීමෙන් පලක් වන්නේ නැහැ. එම දීමනා මඟින් පෞද්ගලිකව තමන්ට හැකි අයුරින් ජනතාවට සහයෝගය ලබා දීමට කටයුතු කරන්න. සභාව විසුරුවා හැරීමෙන් ජනතාවට සේවය කිරීමට ඉතිරියක් වන්නේ නම්, හැකියාවක් පවතිනවානම් ඒ සඳහා සභාපතිවරයා ලෙස මාගේ සම්පූර්ණ එකඟතාවය පල කරන බව දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
අලුත්නුවර, රත්මලවින්න, වෙලන්හින්න ජල යෝජනා ක්‍රමවලින් ජලය බෙදා හැරීමේ දී රටතුල පවතින විදුලි අර්බුධය ඒ සඳහා බලපා තිබුණත් දින 12 ක් අලුත්නුවර ජල යෝජනා ක්‍රමයෙන් ජලය නොලැබුණු බව පිළිගන්න බැහැ. ගැට්ටපාන, කොස්උල, කාසිමුල්ල යන ගම්මානවලට සතියකින් පමණ ජලය නොලැබුණු බව ගම්වාසීන් ප්‍රකාශ කළා. ඒ අනුව ජලය ලබාදීම පිළිබඳව ජල කම්කරු මහතුන් දැනුවත් කළා. විදුලිය ලබා දෙන ලෙස විදුලි අධිකාරිතුමාට දැනුවත් කළා. විදුලිය විසන්ධි වී ඇති ස්ථාන නැවත පිළිසකර කිරීමට යාමට ඉන්ධන නොමැති බව එතුමා පවසමින් ඉන්ධන ලබා දෙන ලෙසට ඉල්ලීම් කළා. රට ගොඩගැනීමේ වගකීම පක්ෂ භේදයකින් තොරව අප සියලු දෙනාගේම වගකීමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුණසේන මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
ප්‍රජාතන්ත්‍රවාදී රටක සාමකාමී ලෙස අරගල කිරීම අයිතියක් බැවින් අරගල කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. රටක ආණ්ඩුවක් පිහිටුවීම සඳහා ඡන්දය දෙනු ලබන ජනතාවම එම ආණ්ඩු බලය ආපසු හරවා යැවීමටත් එම ජනතා කැමැත්තටත් හැකියාව තියෙනවා. එහෙත් ආර්ථික අර්බුධය නිසා දේශපාලන අර්බුධයක් නිර්මාණය වුණා. කෘෂි කාර්මික කටයුතු සඳහා පොහොර නොමැතිවීම, ආහාර පිස ගැනීමට ගෑස් නොමැති කම, ඉන්ධන නොමැතිවීම නිසාත් ඊට විරුද්ධව නැඟී සිටීමත් අරුමයක් නොවේ. ඉන්ධන ලීටරයක් සොයා ගැනීම අද අවශ්‍යතාවය වෙලා තියෙනවා. රට ඒ තත්ත්වයට පත් වෙලා. පාලකයන් ඊට වගකිව යුතුයි. අරගල කිරීම සාධාරණයි. ගෙවල් ගිනි තබන, රාජ්‍ය දේපල විනාශ කරන අයට නොව, සැබෑ ලෙස අරගලකරුවන්ට හදවතේ සහයෝගය ලබා දෙනවා. එහෙත් තරුණ දරුවන් අරගල සඳහා අනවශ්‍ය පෙළඹවීමට කටයුතු නොකළ යුතු අතර අරගල කළ යුතු සීමාව පහදා දිය යුතු අතර එම තරුණ ජවය යහපත් පැත්තකට යොමු කිරීම ද අවශ්‍යයි. නැතහොත් එම තරුණ පිරිස්වලට ඔවුන් පාලනය කර ගැනීමට නොහැකි වෙයි. සිරස මාධ්‍ය ජාලයට පහර දීම හෙළා දකින අතරම දෙරණ මාධ්‍ය ජලය බලෙන් ඇතුල්වීමත් හෙළා දකිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
ගොවි සංවිධාන සම්බන්ධ කරගනිමින් පොහොර බෙදා දීමට වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරි වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
උඩවෙල, අමුපිටිය දක්වා මාර්ගය සංවර්ධන කරනු ලබන කොන්ත්‍රාත් සමාගමට ඉන්ධන නොමැතිවීම නිසා මාර්ගය සංවර්ධනය කිරීමට බාධා වී ඇති බව ප්‍රකාශ කළා. අදවන විට සභාවටත් ඉන්ධන ලබා ගැනීමට නොහැකි වෙලා. නිල රථය සඳහා සමූපාකර ඉන්ධන පිරවුම් හලෙන් කළමනාකරු සමඟ සාකච්ඡා කලත් ඉන්ධන ලබා ගැනීමට නොහැකි වුණා. මේ පිළිබඳව රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී, සාලිය එල්ලාවල මැතිතුමා දැනුවත් කර සහයෝගය ලබා දීමට කටයුතු කරනවා.

## (09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.

ඊළඟ සභා වාරය අගෝස්තු මස 09 වන අඟහරුවාදා දින පැවැත්වීමට කටයුකු කරනවා.

(10). ස්තූති කතාව හා අවසානය.

හත්වන සභාවේ පනස් තුන්වන සභාව සඳහා පැමිණි මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

ඉන් අනතුරුව, පෙ.ව. 11.42 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.